**අධ්‍යාපන අමාත්‍යාංශය**

**සිංහල භාෂාව හා සාහිත්‍ය - III**

**අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 2 යි**

**සැලකිය යුතුයි.**

* උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 05කට පමණක් උත්තර සපයන්න.
* 1 , 2 , 3 , 4 ප්‍රශ්නවලටත් 5 , 6 , 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
* මෙම පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

01. **(I)** සිට **(X)** දක්වා ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(I). " ............ එමහට නොයා එමහැ අඟුල්මල් නම් සොරෙකැ , දරුණෑ , ..............."

(අ) මෙය ශ්‍රවණය කළේ කවු ද?

(ආ) අමාවතුර ග්‍රන්ථයේ අන්තර්ගත පරිච්ඡේද ගණන කීය ද?

(II). ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු
.....................................................................
.....................................................................

(අ) මෙම කවියේ ඉතිරි පද පේළි දෙක සම්පූර්ණ කරන්න.

(ආ) ඉහත පද්‍යයට වඩාත් ගැළපෙන ආප්තෝපදේශය ලියා දක්වන්න.

(III). "රිසි නොවී ද මා පියාට වා සේ මාලිගේ ......"

(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?

(ආ) මෙම කොටස ඇතුළත් නාට්‍යයේ රචකයා පිදුම් ලැබූ සම්මාන දෙකක් ලියන්න.

(IV). " බල පිරිසෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන"

ඉහත කවි දෙපදයෙහි ඉරි ඇඳි පද දෙකේ අර්ථ පිළිවෙළින් ලියන්න.

(V). " මහතෙරුන් කුලගම් සිඟන්නට ගිය කලැ මිනිස්සු ඔවුන් දැකැ **වෙවුලන්මැ යැ , පලත්**

**මැයැ, දොර පියා ලත් මැ යැ** "

(අ) ඉහත කොටසේ තද කළු අකුරින් මුද්‍රිත කොටසින් මතුවන කාව්‍ය අලංකාරය කුමක් ද?

(ආ) මූඪගර්භ , පණිවා යන පදවල තේරුම් ලියන්න.

(VI). (අ) දණ්ඩීන්ගේ 'කාව්‍යාදර්ශ' කෘතිය අනුව ලියැවුණු අනුවාද සිංහල කෘතිය කුමක් ද?

(ආ) එහි කතුවරයා ලෙස පිළිගැනෙන්නේ කවු ද?

(VII). දෙවැට දිග කරදවැල් ආරුක්කු යට සැඟව

නිල්කුරුලු බිලිඳු නිදි ඇහැරවන්නේ කුමට ?

..............................................................

..............................................................

(අ) ඉහත කවියේ ඉතිරි කවි දෙපදය ලියන්න.

(ආ) මෙහි ඇතුළත් උපමාව උපුටා දක්වන්න.

(VIII). " දේවයන් වහන්ස නොසිතා වදාළ මැනව , අනෙක් බලවත් මාගේ උපායෙක් ඇති ....."

(අ) "දේවයන් වහන්ස" යනු කවරක් ද?

(ආ) මෙහි සඳහන් "බලවත් උපාය" කුමක් ද?

(IX). පහත පද්‍ය කණ්ඩයේ ඉරි ඇඳි පදවල අර්ථ වෙන් වෙන් ව ලියන්න.

අවට සුපිපි <u>සරේ ය</u> බිඟු <u>සරේ ය</u>

සිත එවෙහෙර කෙරේය ලොබ කෙරේය

(අ) සරේය

(ආ) සරේය

(X). " එහෙම දෙයක් ගැන අහලවත් නැතුව ඇති මයෙ හිතේ"

(අ) කාගේ ප්‍රකාශයක් ද?

(ආ) "එහෙම දෙයක්" යනුවෙන් අදහස් වන්නේ කුමක් පිළිබඳව ද?

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(I). " සිංහයෙක් වේ මා පියා
<u>ජන්මයෙන්</u> ලත් මේ <u>අරන්නේ</u>
පුරුදු වූ වා සේ සදා
කුමරියක් වේ මාගෙ මවු
උත්තරීතර ජන්ම ලද්දී
උරුම වූ යස ඉසුරටා"

(අ) මෙහි ඉරි ඇඳි පදවල තේරුම් ලියන්න.

(ආ) මෙය ප්‍රකාශ කරන තැනැත්තා හෙළි කරගත් රහස කුමක් ද?

(II). " ....... වළෙන් පසු නැවතත් වැඩ නතර විය. ඒ මෙවරත් සෞඛ්‍ය පරීක්ෂක සති දෙකක් ඇතුළත නොපැමිණි බැවිනි. එහෙත් හය මසකට පමණ පසු යළිත් ඔහු ගෙදරට පාත් වූ කල ...."

(අ) මෙම ප්‍රකාශය අනුව ගැමියන් පිළිබඳ හා සෞඛ්‍ය පරීක්ෂක පිළිබඳ ව පෙනෙන දුර්වල ලක්ෂණයක් බැගින් ලියන්න.

(ආ) පාසලෙන් ලද අධ්‍යාපනයෙන් කථකයා තර්කානුකූල කෙනෙකු බවට පත් වූ බව හැඟෙන ප්‍රකාශයක් උපුටා දක්වන්න.

The National e-learning Portal - The General Education

(III). " දෑසේ කඳුළැලි පිසදා    බලනෙමි
හෙට හිරු එළියට වඩින    දිනේ
.......................................................................
......................................................................."

(අ) ඉහත පද්‍යයේ ඉතිරි පාද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) පැදිපෙළේ පැවසෙන පරිදි මෙහි සඳහන් පියාගේ උතුම් ප්‍රාර්ථනාව ප්‍රකාශිත පද්‍ය පාද දෙක ලියන්න.

(Iv). සැහවෙමි - එබෙමි - නිසසල වෙමි සසල    වෙමි
ඇඹරෙමි - එහෙත් පසු නොබසිමි    නොනවතිමි
කවදා කොතැන දී හෝ මහ මුහුද    හිමි
හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට    දෙමි

(අ) මෙම පද්‍ය පන්තිය රචනා කළ දෘෂ්ටිකෝණය කුමක් ද?

(ආ) මෙම පද්‍ය පන්තියේ කතුවරයා භාවිත කළ කාව්‍ය උපක්‍රම 02ක් ලියන්න.

(v). "....... එ හෙයින් දිවසින් බලනුවෝ ප්‍රාර්ථනාව තෙල ලෙසින් ම සමෘද්ධ වන නියාම දැන සිනා පහළ කළහ. දන් දුන් උපාසිකාවෝ ද සිනා පහළ කළා දැක කාරණාවක් විචාරා නො පියා සමණන්ට ' මුන් වහන්සේ සිනාවක් සී පී සේක .විද්දත් කමෙක් ඇති වනැ' යි"

(අ) ඉහත කොටසේ ඉරි ඇඳි පදවල අර්ථ ලියා දක්වන්න.

(ආ) ඉහත සම්පූර්ණ උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

03. (I). තරුණයෙකුගේ සිතුම් පැතුම් හා ක්‍රියා කලාපය පිළිබඳවත්

(II). පියා කෙරෙහි අසීමිත ආදරයක් දක්වන දියණියක පිළිබඳවත්, සිංහබාහු නාට්‍යයෙන් නිරූපණය වේ.

එක් කොටසකට උදාහරණ අවස්ථා 02 බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

හංස සංදේශ කතුවරයා ,

(I). චමත්කාරජනක ගම්පියසක් පිළිබඳ ව හා

(II). ආර්ථික වශයෙන් සමෘද්ධිමත් ගම්පියසක් පිළිබඳ තොරතුරු දක්වයි.

එක් කොටසකට උදාහරණ 02 බැගින් දක්වමින් මේ බව විමසන්න.

04. උම්මග්ග ජාතකයේ එන,

(I). මහෞෂධ පඬිතුමා තම බුද්ධිය සත්ත්වයාගේ යහපතටත් ,

(II). කේවට්ට බමුණා තම බුද්ධිය බොහෝ දෙනාගේ විනාශයටත් යොදාගත් අයුරු

එක් කොටසකට උදාහරණ අවස්ථා 02 බැගින් දක්වමින් මේ පිළිබඳ පැහැදිලි කරන්න.

**නැතහොත්**

දියමන්ති මාලය කෙටි කතාවේ,

(I). ලොයිසල් මහතා තම බිරිඳට අසීමිතව ආදරයකින් යුතු ස්වාමියෙකි.

(II). මැටිල්ඩා ලොයිසල් සිහින ලොවක ජීවත්වන අයෙකි.

එක් එක් චරිතය සඳහා උදාහරණ 02 බැගින් දක්වමින් මේ පිළිබඳ ව පැහැදිලි කරන්න.

- **5 ,6 , 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.**

05. විවාහ ජීවිතයටත් , සාමාන්‍ය ජීවිතයටත් ජන කවියා උපදෙස් ලබා දුන් අයුරු “ හානා හීය පානා අඬහැරෙන් දැනේ” පද්‍ය පන්තියෙන් උදාහරණ අවස්ථා 03ක් ඇසුරින් පැහැදිලි කරන්න.

06. සද්ධර්මරත්නාවලි කතුවරයාගේ කතාකලාවේ සුවිශේෂී ලක්ෂණ පිළිබඳ ව “ උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව” පාඩමෙන් උදාහරණ අවස්ථා 03ක් දක්වමින් විමසන්න.

07. අජීවී වස්තුවකට සජීවී බව එක් කරමින් ගැඹුරු ජීවන දර්ශනයක් ද පෙන්වීමට එච්.එම්. කුඩලිගම කවියා සමත් වූ අයුරු “ගංගාවේ සංගීතය” පැදිපෙළෙන් උදාහරණ අවස්ථා 03ක් මගින් පැහැදිලි කරන්න.

The National e-learning Portal for The General Education